www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා යුද්ධය පාකිස්ථානයට දිගේලි කරයි

**Obama expands war into Pakistan**

2009 දෙසැම්බර් 9

සතියකට ඉහත දී ඇමරිකන් ජනධිපති ඔබාමා වෙස්ට්පොයින්ට් මිලිටරි ආයතනයේ දී කල කතාවක දී තමා විසින් ඇෆ්ගනිස්ථානය තුල යුද්ධය උත්සන්න කිරීම ඇමරිකානු හමුදා කඩිනමින් ඉවත් කර ගැනීම සඳහා වන පූර්ව සංඥාවක් ලෙස පින්තාරු කලේය. මෙම කතාව මහජනයා මුලා කිරීමට හිතාමතා ම කල දෙයකට වැඩියමක් නොවන බව එදා සිට ම ඇස්පනා පිට ම පෙනෙන්නට පටන් ගත්තේය.

මෙම කතාව ගොතා තිබුනේ මහජනයාට ක්ලෝරෝෆෝම් ගසා යුද්ධය පිලිබඳව තිබෙන දැවන්ත මහජන විරෝධය නොතකා හරිමින් ඔවුන්ව අපසරනය කිරීමට ය.

ඔබාමා විසින් හඹායාමට තීරනය කර තිබෙන ඇත්ත ප්‍රතිපත්තිය වනුයේ ඇෆ්ගනිස්ථානයේ වාඩිලා ගැනීම අනන්ත වූ කාලයක් පවත්වා ගෙන යාම පමනක් නොව යුද්ධය අති දැවැන්ත ආකාරයකින් පකිස්ථානයට ව්‍යාප්ත කිරීම ද බව දැන් පැහැදිලිය.

කතාව පවත්වා පැය කීපයක් ඇතුලත පරිපාලන නිලධාරීහු 2011 ජූනි මස වනවිට ඇමරිකානු හමුදා ඉවත් කිරීම පිලිබඳ "පැහදිලි කිරීම්" කරමින් එවැනි අවසන් දිනයක් නොමැති බවත් එදිනට පසුව ද බොහෝ කලක් ඇමෙරිකානු හමුදා ඇෆ්ගනිස්ථානයේ පලපැදියම් වී සිටිනු ඇති බවත් සහතික කලෝය. ඔබාමාගේ යුද සැලසුමේ ප්‍රධාන කොටසක් වනුයේ ඇමරිකානු නියමුවන් රහිත යානා (ඩ්‍රෝන්) මිසයිල ප්‍රහාර පකිස්ථානයට ව්‍යාප්ත කිරීම සහ පාකිස්ථානයේ කැරලිකරුවන්ට ප්‍රහාර එල්ල කිරීමට ඇමරිකානු විශේෂ ක්‍රියාන්විත බලකායන් පකිස්ථාන භූමිය තුල යෙදවීම ය.

ඔබාමා සිය කතාවේදී පකිස්ථානයට යුද්ධය දිගේලි කිරීම පිලිබඳ කිසිවක් ප්‍රකාශ කලේ නැත. නම සඳහන් නොකල ජ්‍යෙෂ්ට ජනාධිපති උපදේශකයෙකු උපුටා දක්වමින් අඟහරුවාදා *නිව්යෝර්ක් ටයිම්ස්* පුවත්පත ප්‍රකාශ කල පරිදි, "පකිස්ථානයේ කරන්නේ මොනවා වුනත් ඒ ගැන වැඩිය කථා කරන්න ඕන නැති බව අප කලින් ම තීරනය කලා."

යුද්ධය උත්සන්න කිරීමටත් එය පකිස්ථානය දක්වා ව්‍යාප්ත කිරීමටත් මාස ගනනාවක් තිස්සේ උද්ඝෝෂනය කරන *ටයිම්ස්* පුවත්පත පසුගිය මාසයේ දී ධවල මන්දිරය පකිස්ථානයේ සීඅයිඒ මෙහෙයුම් ව්‍යාප්ත කිරීමට අවකාශ සැලසූ බව ඔබාමාගේ කථාවෙන් දිනකට පසුව වාර්තා කලේ ය.

අඟහරුවාදා මෙම පුවත්පත වාර්තා කලේ ඔබාමාගේ දේශනයට පෙරාතුව ඔහුගේ ජාතික ආරක්ෂක උපදේශක ජනරාල් ජේම්ස් එල්. ජෝන්ස්, පකිස්ථාන මිලිටරි හා රහස් ඔත්තු සේවා ප්‍රධානීන් මුනගැසුන බවත් ඔවුන් කැරැලිකරුවන්ට එරෙහි මිලිටරි ප්‍රහාර බලුකිස්ථානය හා වසිරිස්ථානය තෙක් ව්‍යාප්ත නොකලහොත්, "ගෝත්‍රික පෙදෙස්වලින් ඔබ්බට

සොයා ගොස් විනාශ කරන නියමු රහිත යානා ප්‍රහාර යෙදවීමට ඒකපාර්ශවීය පියවර ගන්නා බවත් අල්කයිඩා සහ තලේබාන් නායකයින්ට එරෙහිව රට තුල විශේෂ බලකා ප්‍රහාර ආරම්භ කරන බවත්" ප්‍රකාශ කල බව අනාවරනය කලේය.

අඟහරුවාදා අධිරාජ්‍යවාදී උද්දච්චකමින් ඉහවහා ගිය කතුවැකියකින් *ටයිම්ස්* පත්‍රය පාකිස්ථානයෙන් ඉල්ලා සිටියේ, "කල්මැරීම නතර කොට සටනට බසිනු" යනුවෙනි. ඇමෙරිකානු මිසයිල ප්‍රහාර බලුකිස්ථානය දක්වා විහිදුවීම ඇතුලු පකිස්ථානයට ව්‍යාප්ත වීම පිලිබඳව පුවත්පත මෙසේ ලීවේ යඃ "එවැනි ප්‍රහාරවලින් ප්‍රධාන පෙලේ අන්තවාදීන් ගනනාවක් මරා දැමුන ද පකිස්ථානය තුල මෙය ඉතා දැඩි ලෙස අප්‍රසාදයට ලක්ව තිබෙන තත්වයක දී ඔබාමා මහතා මෙම ක්‍රියාමාර්ගය ව්‍යාප්ත කිරීමේදී විචාරශීලී විය යුතුය. මින් කාරනා තුනක් අදහස් වේඃ ඉලක්ක කිරීමේ දී අතිශය සුපරික්ෂාව, සිවිල් වැසියන් අනතුරට ලක් නොකිරීම හෝ අවම කිරීම (එනම් අවශ්‍ය තරමට මරා දැමීම) සහ ප්‍රසිද්ධියට පත් නොකිරීම."

වෙනත් වචනවලින් නම් ඉලක්කගත ඝාතනයන්, මිසයිල් ප්‍රහාරවලින් මියයන සිවිල් වැසියන් සහ පකිස්ථානය තුල කෙරෙන අනෙකුත් රහසිගත ක්‍රියාකාරීත්වයන් පිලිබඳ ඇමරිකානු ජනතාව අඳුරේ තැබීම ය. එසේ ම එවන් ක්‍රියාවන් පිලිබඳ තොරතුරු වහංගු කිරීමේ දී *ටයිම්ස්* පුවත්පත තම රාජකාරිය ඉෂ්ට සිද්ධ කරනු ඇත.

"මේ වතාවේ දී එක්සත් ජනපදය බොහෝ කාලයක් එහි පැටලිලා ඉන්නා බවට" පකිස්ථානය පොලඹවා ගැනීමට ඔබාමාට සිදුව ඇතැයි පැවසීමට තරම් කතුවැකිය පෙරට ගියේය.

මෙයින් පෙන්නුම් කරන්නේ එක්සත් ජනපද මිලිටරි ආක්‍රමශීලීත්වයේ හා යටත් කරගැනීමේ පෙරනුවූ විරූ ව්‍යාපෘතියක් වන අතර මෙය ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය යන දෙරට ම ඇමරිකානු විජිත බවට පරිවර්තනය කර ගැනීමකි. ජාතික ආරක්ෂක උපදේශක ජෝන්ස්, "අපි කලාපයෙක් ඉවත්ව නොයමු. ඇෆ්ගනිස්ථානයේ දී නැගෙනහිර ඇෆ්ගනිස්ථානය දෙසට වන පකිස්ථාන භූමියේ ද අපට අති දැවැන්ත මූලෝපායික අවශ්‍යතාවන් තිබේ" යැයි මෑතක දී කල ප්‍රකාශයේ අදහස මෙයයි.

ඔබාමාගේ මුසාවාද දේශනයෙන් අනතුරුව මධ්‍යම හා දකුනු ආසියාවේ එක්සත් ජනපද විජිතකරන ආධිපත්‍ය සැලසුම් කිතිකැවුනු අතර ඇමෙරිකානු මාධ්‍ය එය පෝෂනය කරමින් ඇෆ්ගනිස්ථානයේ ඇමෙරිකානු හමුදා කඳවුරු තුල ලැග්ගවීමට රූපවාහිනී කන්ඩායම් යැවීම ද ඇතුලුව යුදවාදී ප්‍රචාරනයේ නව වටයකට ප්‍රවේශ වූයේ ය.

ඇෆ්ගනිස්ථානයේ යුද්ධය තෙල් හා ගෑස්වලින් පොහොසත් වූ මෙන් ම යුරේසියානු මහද්වීපයේ ආධිපත්‍ය සඳහා තීරනාත්මක භූ - මූලෝපායික වැදගත්කමකින් යුක්ත කලාපයක ආධිපත්‍ය සඳහා වන ඇමරිකන් අධිරාජ්‍යවාදයේ භූ-ගෝලීය මූලෝපායේ කොටසක් පමනි. මෙම ධාවනයේ ප්‍රතිවිපාක කලාපයේ ජනතාවට අති විශාල විනාශක් ගෙන එනු ඇත. නිමක් නැති ඝාතන, සමාජ ව්‍යසනය සහ නව විජිතකරන මර්දනයේ බර ඔවුන් මත පැටවෙනු ඇත. එහෙත් මෙය ඇමරිකානු ජනතාවට ද විනාශකාරී වනු ඇත. ඔවුන්ගේ දූ පුතුන් බිල්ලට ගනු ඇති අතර කිසිදා නිම නොවන මිලිටරි මදාවියේ බරපැන ගෙවීමට ඔවුන්ගේ ජීවන තත්වයන් තවදුරටත් කාබාසිනියා කර දමනු ඇත.

පාකිස්ථානය කෙරෙහි වන වොෂිංටනයේ ආක්‍රමනකාරී පිලිවෙතේ අති දැවන්ත වූ මදාවිකාර සාධකයක් තිබේ. එය රට සිවිල් යුද්ධයට ඇද දමනු ඇත. මෙයින් මුලු කලාපය ම වේගයෙන් අස්ථාවරත්වයට ඇද දමනු ඇත. ඉන්දියාව හා පාකිස්ථානය අතර ද ඉන්දියාව හා චීනය අතර ද යුද්ධයක අනතුර ඉහල දැමෙන අතර මෙම රටවල් තුන ම න්‍යෂ්ටික ආයුධ දරති. රුසියාව හා ඉරානය ද මෙම කුනාටුවට ඇදී එනු ඇත.

බුෂ්ගේ විනාශකාරී පාලන වසරවලින් අනතුරුව කඩතොලු වූ ඇමෙරිකානු විදෙස් පිලිවෙතේ යම් යම් පිලිසකර කිරීම්වල දී ඔබාමා නාමිකව යොදවා ගත හැකි වෙතැයි විස්වාස කල ඇමෙරිකානු පාලක ප්‍රභූවේ කොටස් ඔබාමා බලයට ගෙන ඒමට ක්‍රියා කලෝය. ඔබාමා මිලිටරියේ සහ පාලක පන්තියේ ඉතාම නිර්දය කොටස්වල අත්ගෙඩිය බව දැන් පැහදිලිය.

තරුනයින් සහ කම්කරුවන් අති මූලික පාඩම් උකහා ගැනීම අත්‍යවශ්‍යය. යුද්ධයට විරුද්ධව සටන යනු ඔබාමා පරිපාලනයට විරුද්ධ සටන ය. එය ඩිමොක්‍රැටික් පක්ෂයට සහ ධනපති පක්ෂ දෙකේ පද්ධතියට එරෙහි සටනය. එමෙන් ම එය ඇමෙරිකානු අධිරාජ්‍යවාදයට ද එය පදනම්ව පවතින ධනවාදී පද්ධතියට ද එරෙහි සටනකි.

බැරී ග්‍රේ

© www.wsws.org